JMC vLearning
"your virtual learning partner"

# අසම්පූර්ණ වාර්තා මඟින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

## AAT අදියර II

## AFC - උසස් මූල්‍ය ගිණුම්කරණය හා පිරිවැයකරණය


අමිල සම්පත් මුදලිගේ
B.Sc. (Finance) USJ (UG), AAT Passed Finalist (Prize Winner), CASL (Finalist)



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය Estd. 1972
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## <u>අසම්පූර්ණ සටහන් ඇසුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම.</u>

❖ මෙහිදී යොදා ගනු ලබන ක්‍රම දෙකකි.

1. ලාභ සමීකරණය ඇසුරින්
2. අදායම් ප්‍රකාශයක් පිළියෙළ කර ලාභය ගණනය කිරීම.

✓ Refresh your memory 01

**1.6** කේවලස්වාමි (තනි පුද්ගල) ව්‍යාපාරයක් වන **රුවන් ට්‍රේඩර්ස්** හි පොත්වලින්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

| | රු. |
|---|---|
| 2020 මාර්තු 31 දිනට මුළු වත්කම් | 1,550,000 |
| 2020 මාර්තු 31 දිනට වගකීම් | 750,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | 280,000 |
| වර්ෂය තුළ සිදුකළ ගැනිලි | 150,000 |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය වන්නේ:

(1) රු.670,000/- කි. (2) රු.800,000/- කි. (3) රු.370,000/- කි. (4) රු.930,000/- කි.

❖ ඉගෙන ගත යුතු වැදගත් සංකල්ප ,

1. ආරම්භක ප්‍රාග්ධනය ගණනය කිරීම.
2. ණයගැති ගිණුම හා විකුණුම්
3. නයහිමි ගිණුම හා ගැනුම්
4. උපචිත හා කලින් ගෙවූ වියදම්.
5. වෙළඳ ගිණුමේ අයිතමයන් හඳුනා ගැනීම.

**ඉහත සංකල්ප වෙන් වෙන් වශයෙන් දැන් ඉගෙන ගමු.**

1. ආරම්බක ප්රාග්දනය ගණනය කිරීම.

තත්ත්ව විස්තරයක් යොදා ගනිමින් අරම්භක ප්රාග්දනය ගණනය කල හැක.

✓ Example 01 :

**උදාහරණ :**

අමරපාල මහතාගේ තනි ව්‍යාපාරයේ 2019 අප්‍රේල් 01 වන දිනට පහත තොරතුරු ලබාදීඇත.

| | රුපියල් |
|---|---|
| දිගුකාලීන බැංකු ණය (වසරකට 13% පොලියට) | 980,000 |
| බැංකු අයිරාව | 30,000 |
| අතැති මුදල් ශේෂය | 5,000 |
| ණය හිමියෝ | 720,000 |
| ඉඩම් ගොඩනැගිලි | 550,000 |
| බඩු තොගය | 330,000 |
| යන්ත්‍ර | 470,000 |
| මෝටර් රථ | 610,000 |
| උපචිත වියදම් | 30,000 |
| ඉදිරියට කල ගෙවීම් | 45,000 |
| ණය ගැතියෝ | 220,000 |

ඉහත තොරතුරු ආධාරයෙන් 2019 අප්‍රේල් 01 දිනට අමරපාල මහතාගේ ප්‍රාග්ධනය ගණනය කරන්න.

2. ණයගැති ගිණුම හා විකුණුම්

තනි සටහන් හෝ අසම්පූර්ණ වාර්තා ඇති ව්‍යාපාරවල ණයට විකුණුම් සම්බන්ධ තොරතුරු අභ්‍යාස සඳහා ලබා දී නොමැති විටෙක ණයගැති පාලන ගිණුමක් ආධාරයෙන් ආරම්භක ණයගැතියන්, අවසාන ණයගැතියන්ගෙන් හා කාලපරිච්ඡේදය තුළ ලද මුදල් දන්නා විටෙක ණයට විකුණුම් ගණනය කරගත හැකි ය. අනෙකුත් විචල්‍යයන් එකක් හෝ නොමැති විටෙක නොදන්නා විචල්‍යය සෙවීම සඳහා මෙම පාලන ගිණුම් ක්‍රමය භාවිත කළ හැකි බව නිදසුන් පරීක්ෂා කරන විට ඔබට එය පැහැදිලි වේ.

ණයගැති ගිනුමේ ආකෘතිය

**ණයගැති පාලන ගිණුම (රු.)**

| | | | |
|---|---|---|---|
| ආරම්භක ණයගැති ගිණුම | xxx | ලද මුදල් | xxx |
| ණයට විකුණුම් | xxx | බොල්ණය | xxx |
| | | ණයගැතියන්ට දුන් වට්ටම් | xxx |
| | | අවසාන ණයගැතියෝ | xxx |
| | **xxx** | | **xxx** |

✓ Example 03 :

බිංදුසේනගේ ව්‍යාපාරයේ 2019 අප්‍රේල් 01 වන දිනට ණයගැතියන්ගේ ශේෂය රු. 320,000 ක් විය. එය 2020 මාර්තු 31 දිනට රු. 430,000 ක් විය. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැතියන්ගෙන් ලද මුළු මුදල් ප්‍රමාණය රු. 540,000 ක් වේ. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයට විකුණුම් ගණනය කරන්න.

✓ Example 04 :

ඉහත බිංදුසේනගේ ව්‍යාපාරය විසින් වර්ෂය තුළදී රු. 30,000 ක් ණයගැතියන්ට වට්ටම් ලබාදුන්නේ නම් හා වර්ෂය තුළදී රු. 10,000 ක් බොල්ණය ලෙස කපා හරින ලද්දේ නම්ණයගැතියන්ට කළ විකුණුම් වන්නේ,

### 3. නයහිමි ගිණුම හා ගැනුම්

ව්‍යාපාරය ණයට විකුණුම් පිළිබඳව සටහන් පවත්වාගෙන නොයන විටෙක ආරම්භකහා අවසාන ණයහිමියන්ගේ ශේෂයන් සහ ණයහිමියන්ට ගෙවූ මුදල් දී ඇති විටෙක ණයට ගැණුම් ගණනය කළ හැකි ය. ඒ සඳහා පෙර පරිදිම ණයහිමි පාලන ගිණුමක් භාවිත කළ හැකි ය.

නයහිමි ගිනුමේ ආකෘතිය

**ණයහිමි පාලන ගිණුම (රු.)**

| | | | |
|---|---|---|---|
| ගෙවූ මුදල් | xxx | ආරම්භක ණයහිමියෝ | xxx |
| අවසාන ණයහිමියෝ | xxx | ණයට ගැණුම් | xxx |
| | **xxx** | | **xxx** |

✓ Example 05 :

නයනාගේ ව්‍යාපාරයේ 2020.04.01 දිනට නයහිමි ශේෂය රු. 420,000 කි. එය 2021.03.31 දිනට රු. 650,000 කි. 2021.03.31 දිනෙන් අවසන් වෂර්ය සඳහා රු. 500,000 කි. තවද වෂර්ය තුල නයහිමියන්ගෙන් රු. 50,000 වට්ටන්ම් ලැබෙනේ නම් , 2020.03.31 දිනෙන් අවසන් වෂර්ය සඳහා නයට ගැනුම් කීයද ?

4. උපචිත හා කලින් ගෙවූ වියදම්.

✓ Example 06 :

ෆර්නි මහත්මියගේ ව්‍යාපාරයේ 2019 අප්‍රේල් 01 දිනට කලින් ගෙවූ (ඉදිරියට කළ) ගෙවල් කුලිය රු. 20,000 කි. 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී ගෙවල්කුලිය ලෙස රු. 140,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2020 මාර්තු 31 දින වන විට ඉදිරියට කළ ගෙවල් කුලී වියදම රු. 40,000කි. වර්ෂයට අදාළ ගෙවල් කුලී වියදම නැතහොත් ගෙවල් කුලිය ලෙස ලාභාලාභ ගිණුමටහර කරන අගය ගණනය කරන්න.

✓ Example 07 :

ගයාන් මහත්මාගේ ව්‍යාපාරය විසින් 2019.04.01 වන විට (හිඟ හිටි) උපචිතව තිබූ ප්‍රචාරණ වියදම රු. 15,000 කි. වර්ෂය තුළ දී ප්‍රචාරණ වියදම ලෙස රු. 85,000 ක් ගෙවා තිබූ අතර 2020.03.31 දිනට උපචිත ප්‍රචාරණ වියදම රු. 30,000 කි. ඒ අනුව ප්‍රචාරණ වියදම ලෙස ලාභාලාභා ගිණුමට හර කරන අගය ගණනය කරන්න.

5.වෙලද ගිණුමේ අයිතමයන් හදුනා ගැනීම .

ව්‍යාපාර ලෝකය ගැන මනා පරිචයක් ඇති ව්‍යාපාරිකයන් තමන්ගේ ව්‍යාපාරයේ ලාභපාඩු පිළිබඳව අවසාන ගිණුම් වාර්තා පිළියෙළ කිරීමටත් පෙර එකී කාලපරිච්ඡේදය තුළ දී උපයා ඇති ලාභය, පාඩුව හා මූල්‍ය තත්ත්වය පිළිබඳව හොඳ අවබෝධයක් සහිතව කටයුතු කරනවා විය හැකිය. ඒ අනුව තමාගේ ව්‍යාපාරයේ දළ ලාභය සහ ශුද්ධ ලාභ අනුපාතිකයන් දළ වශයෙන් සඳහන් කිරීමට ඔවුන්ට හැකියාවක් ඇත.

දළ ලාභ අනුපාතය විකුණුම්වලට 20% ක් වන විට,

දළ ලාභ අනුපාතය = (දළ ලාභය / විකුණුම්) × 100

= 20%

දළ ලාභ අනුපාතය පිරිවැයට 20% වන විට,

දළ ලාභ අනුපාතය = (දළ ලාභය / පිරිවැය) × 100

= 20%

✓ Example 08 :

වරින්ද මහතාගේ ව්‍යාපාරයේ 2019 අප්‍රේල් 01 වෙනි දිනට ගිණුම් වර්ෂ ආරම්භයේ දී පැවති තොගයේ වටිනාකම රු. 240,000 ක් වූ අතර 2020 මාර්තු 31 දිනට තොගයේ වටිනාකම රු. 310,000 කි. වර්ෂය තුළ මිලට ගත් තොගය රු. 640,000 ක් වූ අතර එයින් රු. 30,000 ක තොගයක් හරවා යැවුණි. කාලපරිච්ඡේදය ඇතුළත දී අයිතිකරු විසින් රු. 50,000 ක තොග සිය පෞද්ගලික අවශ්‍යතාවයක් මත පරිත්‍යාග කර තිබූ අතර රු. 10,000 ක තොග වර්ෂාව නිසා හානියට පත් විය. විකුණු භාණ්ඩවල පිරිවැය හෙවත් විකුණුම් පිරිවැය ගණනය කරන්න.